5.06.2016

ද මැසිනොද් විදුහල, කඳාන

# පුරවැසි අධ්‍යාපනය

Learning Resource Centre
De Mazenod College
Kandana

පළමු වාර පරීක්ෂණය 2016 — 10 ශ්‍රේණිය

වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1) ඈත අතීතයේ සිටම මිනිසා තම අවශ්‍යතා සපුරා ගැනීමේ පහසුව සලකා
   1. තනිවම ජීවත් වීමට පුරුදුව ඇත
   2. පවුලක් ලෙස ජීවත් වීමට පුරුදුව ඇත
   3. කණ්ඩායමක් ලෙස ජීවත් වීමට පුරුදුව ඇත
   4. සාමූහිකව ජීවත් වීමට පුරුදුව ඇත

2) ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා පැවති ක්‍රමයක් නොවන්නේ
   1. රාජාණ්ඩු ක්‍රමය
   2. ගෝත්‍ර ක්‍රමය
   3. රදළ ආණ්ඩු ක්‍රමය
   4. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම

3) ඍජුව හෝ වක්‍ර අන්දමින් පාලන කටයුතු සඳහා ජනතාවට සහභාගී වීමට ඉඩ ලැබෙන පාලන ක්‍රමය
   1. කැබිනට් ආණ්ඩුක්‍රමය වේ
   2. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය වේ
   3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වේ
   4. මින් එකක්වත් පිළිගත නොහැක

4) ඇතන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනයකි
   1. ජනතා සභාවයි
   2. පුරවැසි සභාවයි
   3. විධායක සභාවයි
   4. මන්ත්‍රණ සභාවයි

5) ක්‍රි පූ 6 වන සියවසේ ඉන්දියාවේ වජ්ජි ජනපදයේ
   1. කැබිනට් ආණ්ඩු ක්‍රමයක් පැවත ඇත
   2. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පැවත ඇත
   3. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් පැවත ඇත
   4. සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවත ඇත

6) ක්‍රි ව 5 සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවතුණේ
   1. ගෝත්‍ර ක්‍රමයකි
   2. වැඩවසම් ක්‍රමයකි
   3. රදළ ක්‍රමයකි
   4. මින් එකක්වත් පිළිගත නොහැක

7) යුරෝපයේ ජාතික රාජ්‍යය බිහිවීම ආරම්භ වූයේ
   1. 12 වන සියවසේදිය
   2. 13 වන සියවසේදිය
   3. 14 වන සියවසෙන් පසුවය
   4. 15 වන සියවසෙන් පසුවය

8) මෙම විප්ලවයෙන් පසු ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වන්නට විය
   1. 1789 විප්ලවය
   2. 1917 විප්ලවය
   3. 1688 විප්ලවය
   4. 1816 විප්ලවය

9) " ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම පුරවැසිකම් හිමිවන පාලන ක්‍රමයකි " මෙය ප්‍රකාශ කරනු ලැබුවේ
   1. ඒබ්‍රහම් ලින්කන්ය
   2. සීලර්ය
   3. ඇරිස්ටෝටල්ය
   4. ප්ලේටෝය

10) ප්‍රජාතන්ත්‍රවාදයේ ජීව ගුණය ලෙස සැලකිය හැක්කේ
   1. අන්මත ගරු කිරීමය
   2. අන්මත ඉවසීමය
   3. සාකච්ඡා මගින් තීරණ ගැනීමය
   4. අයිතීන් භුක්ති විඳීමය

පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න

1. දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයක් නොවේ ( )
2. දේශපාලන පක්ෂ රාශියක් ක්‍රියාත්මක වන්නේ නම් බහු පක්ෂ ක්‍රමයක් ලෙස දැක්විය හැක ( )
3. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් ලෙස අත්තනෝමතික පාලනයක් බිහිවීම දැක්විය හැකිය ( )
4. ද්වි පක්ෂ ක්‍රමයක් පවතින රටක් ලෙස රුසියාව දැක්විය හැකිය ( )
5. ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදු කරනු ලබන්නේ මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව මගිනි ( )
6. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භූමිය හා ජනගහනය ප්‍රධාන නිර්ණායක ලෙස භාවිතා නොකරයි ( )
7. නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම නිදහස් සාධාරණ මැතිවරණයක ලක්ෂණයකි ( )
8. ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මක විවේචනයක් තුළින් ආණ්ඩුවසුමගට යොමු කිරීම විරුද්ධ පක්ෂයෙන් ඉටු නොවිය යුතු කාර්යයකි ( )
9. රටේ මූලික නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි ( )
10. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින රටක ජනතාවට තම අදහස් ප්‍රකාශ කිරීමටත් තොරතුරු දැන ගැනීමටත් නිදහස නැත ( )

## II කොටස

පහත සඳහන් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න

1)
1. ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් ඔබ අදහස් කරනු ලබන්නේ කුමක්ද?
2. ග්‍රීසියේ ඇතන්ස් පෞර රාජ්‍යය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න
3. ඉන්දියාවේ වජ්ජි ජනපදයේ පාලන කටයුතු වලදී අනුගමනය කළ සප්ත අපරිහානිය ධර්ම කිපයක් දක්වන්න

2)
1. ප්‍රජාතන්ත්‍රවාදයේ විවිධ ස්වරූපයක් දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න
2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුව ඇති ගැටලු මොනවාද?
3. අද ක්‍රියාත්මක වන්නේ කුමන ප්‍රජාතන්ත්‍රවාදයද? එහි ඇති විශේෂත්වය කුමක්ද?

3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න

4)
1. දේශපාලන පක්ෂයක් යනු කුමක්ද?
2. දේශපාලන පක්ස වර්ග කොට දක්වන්නේ කෙසේද?
3. තරගකාරී පක්ෂ ක්‍රමයක දැකිය හැකි යහපත් ලක්ෂණ මොනවාද?

5)
1. රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?
2. රාජ්‍යය ආණ්ඩුවෙන් වෙනස් වන්නේ කෙස්ද?
3. ජාතික රාජ්‍යය බිහිවීම ආරම්භ වන්නේ කිනම් කාල වකවානුවේද?
4. ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතු මොනවාද?

6)
1. මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාදේශීය පාලන ඒකක වෙත පලය බෙදා ඇති ආකාරය අනුව රාජ්‍යයන් වර්ග කොට දක්වන්නේ කෙසේද? කෙටියෙන් හඳුන්වන්න
2. ආණ්ඩුව සකස් වී ඇති අංග මොනවාද? ඒවා පිළිබඳ විස්තර කරන්න

7) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සහ ජනාධිපති ආණ්ඩුක්‍රමයක ඔබ දකින අසමනතා මොනවාද? වෙන වෙනම දක්වන්න

8) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශය සාදක පිළිබඳ රචනයක් ලියන්න